# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1833/32 – 2013 ඔක්තෝබර් 25 වැනි සිකුරාදා – 2013.10.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

සබරගමු පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, ඉඹුල්පේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කඩවත කෝරළේ සුළු කොට්ඨාසයේ, උගුරුස්සගහඅරාව අ. ග. පි. 06 ගමේ පිහිටි, රත්නපුර දිස්ත්‍රික්කයේ ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් පිළියෙල කරන ලද අංක ආර්/අයිඑම්බී/2012/909 හා 2012.12.14 දිනැති ප්‍රගමන අනුරේඛනයේ කැබලි අක්ෂර 'ඒ' වශයෙන් දක්වා ඇති ප්‍රමාණයෙන් හෙක්. 01 ක් වූ ඉඩම් කොටසට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – උගුරුස්සගහඅරාව – ප්‍රමාණය: හෙක්. 01**

උතුරට: මාර්ග (ප්‍රා.ස.) සහ උපුල් නාලින්ද හිමිකම් කියන ඉඩම; නැගෙනහිරට: උපුල් නාලින්ද හිමිකම් කියන ඉඩම සහ ෆීලික්ස් පී. කුරේ හිමිකම් කියන ඉඩම; දකුණට: ෆීලික්ස් පී. කුරේ හිමිකම් කියන ඉඩම සහ බලංගොඩ වතු සමාගම කැපොක්වත්ත කොටසට හිමිකම් කියන ඉඩම; බටහිරට: බලංගොඩ වතු සමාගම කැපොක්වත්ත කොටසට හිමිකම් කියන ඉඩම සහ මාර්ග (ප්‍රා.ස.).

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

මගේ අංකය (පැරණි): ඉප්‍රා/20/17/එල්එල්ඒ/2012/01.
මගේ අංකය (නව): අයිඑම්ඩීඑස්/එල්එන්ඩී/05/ඒසීකිව්/2012/01.
යොමු අංකය: 4/3/4/2012/ඩී/228.
2013 අගෝස්තු මස 28 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
'මිහිකත මැදුර',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

11 – 363


1A – G 18431 – 170 (2013/10) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අතිවිශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*